# මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරග විභාගය - 2025

1. මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන සීමිත තරග විභාගයේ ලිඛිත පරීක්ෂණය විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් 2026 ජනවාරි මස පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. ඒ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත (online) ක්‍රමයට පමණි. අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය 2025 ඔක්තෝබර් 21 දින වේ.

සටහන - මාර්ගගත අයදුම්පත් භාරගැනීම **2025** සැප්තැම්බර් **22** වැනි දින පෙ.ව. **9.00**ට විවෘත වන අතර **2025** ඔක්තෝබර් මස **21** වැනි දින රාත්‍රී **9.00**ට අවසන් වේ.

2. මෙම විභාගය මහනුවර නගරයේදී පවත්වනු ලැබේ. විභාග මධ්‍යස්ථාන ස්ථාපනය කරනු ලබන නගරය හා ඊට අදාළ නගර අංකය පහතින් දැක්වේ.

| නගරය | නගර අංකය |
|---|---|
| මහනුවර | 02 |

3. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

4. මෙම තරග විභාගය හෝ මෙම තරග විභාගයට සමාන්තරව පැවැත්වෙන කුසලතා ධාරාව යටතේ මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීමේ තරග විභාගය යන විභාග දෙකෙන් පළමුව පැවැත්වෙන විභාගයේ, විභාගය පැවැත්වෙන අවසාන දිනට මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධි ශ්‍රේණියේ පවතින පුරප්පාඩුවලින් 50%ක් මෙම තරග විභාගය මගින් සම්පූර්ණ කරනු ලැබේ. එම පුරප්පාඩු සංඛ්‍යාව අදාළ විභාගයේ අවසන් දිනට පසු මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ දැන්වීමක් පළ කිරීම මගින් ප්‍රසිද්ධ කිරීමට කටයුතු කරන අතර එසේ ප්‍රසිද්ධ කළ පසු පුරප්පාඩු සංඛ්‍යාව නැවත සංශෝධනය කරනු නොලැබේ.

5. 2025.03.25 දිනැති හා අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි MN 07-2025 වැටුප් කේතය මෙම තනතුරට හිමි වන අතර එයට අදාළ මාසික වැටුප් පරිමාණය රු.71,240/- 11x1,360 - 18x1,850 - රු.119,500/-ක් වේ. එම වැටුප ඔබට හිමි වන්නේ 2027.01.01 දින සිට වේ. පත්වීම ක්‍රියාත්මක වන දින සිට ඔබට මෙම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

6. **සපුරාලිය යුතු සුදුසුකම් :-**

අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානවලට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොමැති <u>මධ්‍යම පළාත් රාජ්‍ය සේවයට අයත්,</u>

(අ) කළමනාකරණ සේවා නිලධාරි සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරියකු වීම,

හෝ

(ආ) අවම වශයෙන් සේවයේ වසර අටකට (08) නොඅඩු සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ කළමනාකරණ සේවා නිලධාරි සේවයේ II ශ්‍රේණියේ නිලධාරියකු වීම,

හෝ

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිය සමත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ වසර 05 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරියකු වීම.

සහ

(ඈ) නියමිත දිනට අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ කිරීම.

සටහන I

මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ දැනට රැඳී සිටින ශ්‍රේණිය අනුව ඉහත (අ),(ආ),(ඇ) මඟින් දක්වා ඇති සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කරන ලද, දැනට රැඳී සිටින ශ්‍රේණියට අදාළව සමත් විය යුතු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව සම්පූර්ණ කළ යුතු වන අවම වාර ගණන තුළ අයදුම්පත් කැඳවීමේ අවසාන දින වන විට සමත් වූ නමුත් පරිපාලන හේතු මත අදාළ කාර්යක්ෂමතා කඩඉම් සහනය ප්‍රමාදවීම නිසා සේවයේ ස්ථිරවීම හෝ උසස්වීම හෝ අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට අහිමිවීම නිසා පමණක් සතුටුදායක සේවා කාලය සම්පූර්ණ කිරීමට නොහැකි වූ නිලධාරීන්ට ද මෙම විභාගයට අයදුම් කළ හැකි වේ.

සටහන II

කෙසේ වෙතත් එම නිලධාරීන්ට අයදුම් කිරීමට සහ විභාගයට පෙනී සිටීමට අවස්ථාව ලබාදීම උසස්වීම ලබා ගැනීම සඳහා සුදුසුකමක් නොවන අතර අධිශ්‍රේණියට උසස්වීම් ලිපිය නිකුත් කරනු ලබන්නේ නිසි පරිදි මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ සතුටුදායක සේවා කාලය සපුරන ලද බවට සෑහීමට පත්ව අදාළ ස්ථිර කිරීම /උසස් කිරීම උපයාගත් පසුව වේ.

**7. විභාග කොන්දේසි : -**

(i) විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයකුට කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක. අපේක්ෂකයන් මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයකුම ප්‍රශ්න පත්‍ර සියල්ලටම පෙනී සිටිය යුතුය.

(ii) මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් සම්පූර්ණ කළ යුතුය. සිංහලෙන් හෝ දෙමළෙන් සම්පූර්ණ කරන ලෙස උපදෙස් ලබා දී ඇති කොටස් පමණක් නිවැරදිව එම භාෂාවලින් සම්පූර්ණ කළ යුතු වේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instructions) බාගත කර, කියවා, අයදුම්පත පිරවීමේදී එම උපදෙස් තරයේ පිළිපැදිය යුතුය. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(iii) මාර්ගගත ක්‍රමය ඔස්සේ නිවැරදිව සම්පූර්ණ කර බාගත කරන ලද මුද්‍රිත අයදුම්පත, තමන් සේවය කරන දෙපාර්තමේන්තු ප්‍රධානියා/ අමාත්‍යාංශ ලේකම්වරයා මඟින් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහල කෙළවරේ **"මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධිශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරඟ විභාගය - 2025"** යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

"ලේකම්,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 244, කටුගස්තොට පාර,
මහනුවර."

(iv) විභාග ගාස්තුව රු.1,200/- කි. පළමුවරට මෙම විභාගය සඳහා අයදුම්කරන අයදුම්කරුවන්ගෙන් විභාග ගාස්තු අයකරනු නොලැබේ. පළමුවරට අයදුම්කරන අයදුම්කරුවන් ලෙස සලකන්නේ සාමාන්‍ය ලිපිකාර සේවයේ අධිපන්තියට පත් කිරීම සඳහා 1980, 1982, 1983, 1984, 1985, 1986, 1987, 1988, 1989, 1991, 1996, 1999 හෝ 2001 වර්ෂවල පවත්වන ලද සීමිත තරග විභාගයකට පෙනී නොසිටි අයදුම්කරුවන්ගෙන් හා 1985 හා 1996 වර්ෂවල පවත්වන ලද රජයේ/මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ යතුරු ලේඛක සේවයේ අධි පන්තියේ සීමිත තරග විභාගයකට පෙනී නොසිටි අයදුම්කරුවන්ගෙන් හා 1996 වර්ෂයේදී පවත්වන ලද රජයේ/මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ලඝුලේඛක සේවයේ අධි පන්තියේ සීමිත තරග විභාගයකට පෙනී නොසිටි අයදුම්කරුවන්ගෙන් හා 1999 වර්ෂයේදී පවත්වන ලද රජයේ/මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පොත් තබන්නා සේවයේ, රජයේ/මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ සරප් සේවයේ හෝ රජයේ/මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ගබඩා භාරකාර සේවයේ අධි පන්තියේ සීමිත තරග විභාගයකට හා 2006, 2007, 2011, 2015, 2018 සහ 2023 වර්ෂවලදී පවත්වන ලද මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධිපන්තියට උසස් කිරීමේ සීමිත තරග විභාගය යන විභාග අතුරෙන් එකදු විභාගයකට හෝ පෙනී නොසිටි අයදුම්කරුවන් පමණක් වේ.

*පූර්ව විභාගයකට අයදුම්පත් යොමු කර විභාග ප්‍රවේශ පත්‍රය ලැබීමෙන් පසු කවර හෝ කරුණක් මත විභාගයට පෙනී නොසිටිය ද එම අයදුම්කරුවන් මෙම විභාගයේදී විභාග ගාස්තු ගෙවීමට කටයුතු කළ යුතු වේ.

*පළමුවරට විභාගයට පෙනී සිටින බවට සාවද්‍ය ලෙස පවසමින් ගාස්තු නොගෙවා මෙම විභාගයට පෙනී සිට, ඒ බව අනාවරණය වීමෙන් පසු ගනු ලබන ක්‍රියාමාර්ගවල අහිතකර ප්‍රතිඵල නිලධාරියා විසින් ද ආයතන ප්‍රධානියා විසින් ද විඳ දරා ගත යුතු වේ.

විභාග ගාස්තු ගෙවීම මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත දැක්වෙන ගාස්තු ගෙවීම් ක්‍රමවේද යටතේ පමණක් සිදු කළ යුතුය.

(i) ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)

(ii) ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card)

(iii) ලංකා බැංකු ඔන්ලයින් බැන්කින් ක්‍රමය මගින්
(Bank of Ceylon Online Banking Method)

(iv) ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Bank of Ceylon Teller Slip Payment)

සටහන : ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

(v) ගෙවීම ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

(vi) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කරනු නොලැබේ.

(vii) විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කර තිබිය යුතුය.

(viii) විභාග නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව සඳහන් කරමින් වෙබ් නිවේදනයක් මඟින්/ අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මඟින් දන්වනු ලැබේ.

නිවේදනය පළවී දින 02ක් හෝ 03ක් ගතවූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සුදානමින් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදුකර ගත යුතුය. විභාග ශාලාවේදී / සම්මුඛ පරීක්ෂණයේදී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

## 8. විභාගයට ඇතුළත් කර ගැනීම

(අ) විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින විභාග දිනයේදී, එහි විභාග මධ්‍යස්ථාන භාර ශාලාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම නිවේදනයේ පළ කර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට හෝ සිදුවනු ඇත.

**සටහන :- අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීම සඳහා වන මෙම නිවේදනයේ 06 ඡේදයේ සඳහන් මූලික සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.**

9. අපේක්ෂකයන්ගේ අනන්‍යතාව :-

විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලේඛන පමණක් වලංගුය.

I. ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයන් සිය අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

**10. සාවද්‍ය තොරතුරු සැපයීම සඳහා දඬුවම් : -**

(අ) මෙම විභාගයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනියන ලද නම්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර අවස්ථාවකදී වුවද ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

(ආ) අපේක්ෂකයකු විසින් සපයන ලද තොරතුරු පසු කලකදී වැරදි බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය විසින් හිතා මතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව හෙළිවුවහොත් හෝ ඔහුට/ඇයට තවදුරටත් උසස් වීමක් ලබා දීම සම්බන්ධයෙන් සළකා බලනු නොලබන අතර, මෙම විභාගය හේතු කොට ගෙන දී තිබූ උසස් වීමක් අහෝසි කිරීමට හෝ රජයේ සේවයෙන් පහ කිරීමට වුව ද යටත් වේ.

11. විභාග පරිපාටිය : - ලිඛිත පරීක්ෂණය පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත වේ.

| | ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු |
|---|---|---|---|
| 1 | කාර්යාල කළමනාකරණය | පැය 02 | 100 |
| 2 | කාර්යාල ක්‍රම | පැය 02 | 100 |
| 3 | ආයතන කාර්ය හා කාර්ය පටිපාටික රීති | පැය 02 | 100 |
| 4 | රාජ්‍ය මූල්‍ය කළමනාකරණය | පැය 02 | 100 |
| 5 | පොදු ප්‍රශ්න පත්‍රය | පැය 01 1/2 | 100 |

**12. විෂය නිර්දේශය : - ඉහත විෂයයන්ට අදාළ විෂය නිර්දේශය පහත පරිදි වේ.**

I. කාර්යාල කළමනාකරණය (කාලය පැය 02 යි. ලකුණු 100 යි.)
සංවිධාන ව්‍යුහය, සංවිධාන පිළිබඳ මූලධර්මය, කාර්ය විශ්ලේෂණය හා කාර්ය ඇගයුම්, නායකත්වය, අධීක්ෂණය හා තීරණ ගැනීමේ හැකියාව, සංදේශනය, මහජන සම්බන්ධතාව, සම්බන්ධීකරණය හා ගැටලු නිරාකරණය.

II. කාර්යාල ක්‍රම (කාලය පැය 02 යි. ලකුණු 100 යි.)
කාර්යාල ක්‍රම පිළිබඳ මූලධර්ම, කාර්යාල පටිපාටි, ලේඛන සහ ගොනු කිරීම, ආකෘති පත්‍ර පාලනය හා ආකෘති පත්‍ර සැලසුම් කිරීම, ලිපි ගනුදෙනු කිරීම, කාර්යාල උපකරණ භාවිතය පිළිබඳ පාලනය, කාර්යාලයේ සැලැස්ම හා වටපිටාව, රැකියා විස්තරය, වැඩ අධ්‍යයනය හා ක්‍රම අධ්‍යයනය, වැඩ මැනීම, කාර්යාල මෙහෙයුම් අත්පොත.

III. ආයතන කාර්ය හා කාර්ය පටිපාටික රීති (කාලය පැය 02 යි. ලකුණු 100 යි.)
රාජ්‍ය සේවයට බඳවා ගැනීමේදී අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග, රාජ්‍ය නිලධාරීන්ගේ ආයතනික කටයුතු, පෞද්ගලික ලිපිගොනුවක් පවත්වාගෙන යාම, රාජ්‍ය සේවකයන් පත් කිරීම, මාරු කිරීම, උසස් කිරීම හා සේවය අවසන් කිරීම යන කාර්යයන්හි බලතල පැවරීම, සුභ සාධනය, රාජ්‍ය නිලධාරීන්ට හිමි වරප්‍රසාද, ආයතන කාර්ය පිළිබඳව රජය විසින් මෙතෙක් නිකුත් කර ඇති රෙගුලාසි හා චක්‍රලේඛ පිළිබඳව සාමාන්‍ය අවබෝධය පරීක්ෂා කෙරේ.

IV. රාජ්‍ය මූල්‍ය කළමනාකරණය (කාලය පැය 02 යි. ලකුණු 100 යි.)
වාර්ෂික ඇස්තමේන්තු හා ගණන් දීමේ නිලධාරියකුගේ වගකීම්, මුදල් පාලනය, මූල්‍ය වගකීම් පැවරීම, මුදල් භාර ගැනීම, ගිණුම් ගත කිරීම හා ප්‍රතිග්‍රහණය කිරීම, ගෙවීම්, රාජ්‍ය මුදල් භාරකාරත්වය, අග්‍රිම හා බැංකු ගිණුම්, සැපයුම් හා සේවාවන්, ප්‍රසම්පාදන කටයුතු, භාණ්ඩ සමීක්ෂණ, විගණන විමසුම්, රජයේ කාර්යාලවල භාවිත වන ලෙජර්, ආදායම් හා වියදම් සාරාංශ, බැංකු සැසඳුම් හා මූල්‍ය පාලන පොත්පත්, රාජ්‍ය මුදල් භාවිතය පිළිබඳව මෙතෙක් නිකුත් කර ඇති චක්‍රලේඛ හා රෙගුලාසි පිළිබඳ සාමාන්‍ය අවබෝධය පරීක්ෂා කෙරේ.

V. පොදු ප්‍රශ්න පත්‍රය (කාලය පැය 1 1/2 යි. ලකුණු 100 යි.)
රාජ්‍ය පරිපාලනයේ ස්වභාවය, රාජ්‍ය පරිපාලන ව්‍යුහය, රාජ්‍ය ප්‍රතිපත්ති හා නව රාජ්‍ය ප්‍රතිසංස්කරණ, මූලික අයිතිවාසිකම්, මානව හිමිකම් කොමිෂන් සභාව, ඔම්බුඩ්ස්මන්වරයා, පාර්ලිමේන්තු මහජන පෙත්සම් කාරක සභාව, කාර්යාල සංස්කෘතිය, ආචාරධර්ම හා සාරධර්ම, මැනවින් කාර්යාල භෞතික පරිසරය නිර්මාණය කිරීම සහ කාර්ය මණ්ඩලයේ සුභ සාධන කටයුතු, නිල තත්වය හා සිවිල් තත්වය පිළිබඳ සමාජ විද්‍යාත්මක පිළිගැනීම, සේවාලාභීන්ට රාජ්‍ය නිලධාරීන්ගෙන් ඉටුවිය යුතු යුතුකම්.

**13. පත්කිරීම සඳහා තෝරා ගැනීම : -**

I. මෙම විභාගයට අදාළ සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට සුදුසුකම් ලැබීම සඳහා එක් එක් විෂයය සඳහා අවම වශයෙන් යටත් පිරිසෙන් ලකුණු 40 බැගින්වත් ලබාගත යුතු වේ. විභාගයේදී ලබා ගන්නා මුළු ලකුණුවල එකතුව අනුව සැකසෙන කුසලතා අනුපිළිවෙළ අනුව ඉහළම ලකුණු ලබාගත්, සීමිත තරග විභාගය සඳහා වෙන් කර ඇති පුරප්පාඩු සංඛ්‍යාව හා පුරප්පාඩු සංඛ්‍යාව මෙන් 10%ක් යන දෙකෙහි එකතුවට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් හමුවට කැඳවනු ලැබේ. එම සම්මුඛ පරීක්ෂණය අයදුම්කරුවන්ගේ සුදුසුකම් සනාථ කෙරෙන සහතික පරීක්ෂා කිරීම සඳහා පමණක් වන අතර එහිදී ලකුණු ලබා දීමක් සිදු නොවේ. තෝරාගනු ලබන අයදුම්කරුවන් අධි ශ්‍රේණියේ පුරප්පාඩු පවතින මධ්‍යම පළාතේ පිහිටි ඕනෑම කාර්යාලයක සේවය කිරීමට යටත් වන අතර අනුයුක්ත කෙරෙන කාර්යාලයේ පත්වීම් භාර ගැනීම ප්‍රතික්ෂේප කළහොත් ඔහුගේ/ඇයගේ පත්වීම අවලංගු කර ඊළඟට සුදුසුකම් ලබන අයදුම්කරුවන් පිළිවෙළින් කැඳවා පුරප්පාඩු සම්පූර්ණ කරනු ලැබේ.

II. කුසලතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු පුරවාගෙන යාමේදී කිසියම් අවස්ථාවක ඉතිරිව ඇති පුරප්පාඩු සංඛ්‍යාවට වැඩි සංඛ්‍යාවක් සම ලකුණු ලබා ගත් සුදුසුකම් ලත් අපේක්ෂකයන් සිටී නම් හා එම පුරප්පාඩු ද පිරවීමෙ සේවා අවශ්‍යතාවක් තත්කාලයේ පවතී නම්, එසේ සම ලකුණු ලබාගත් අපේක්ෂකයන් අතුරින් වැඩිදුර තෝරා ගැනීමක් සිදුකිරීමට මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකිය. මෙම තෝරා ගැනීමේ පටිපාටිය පහත පරිදි කොටස් දෙකකින් යුක්තය.

i. අපේක්ෂකයන්ගේ හැකියාව ඇගයීම සඳහා වූ ලිඛිත පරීක්ෂණය
ii. කුසලතා පාදක සම්මුඛ පරීක්ෂණය

ලිඛිත පරීක්ෂණය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින් පැවැත්වෙනු ඇත.

සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලැබේ.

මෙම තෝරා ගැනීමේ පටිපාටියේ ව්‍යුහය හා අන්තර්ගතය පිළිබඳ වැඩිදුර තොරතුරු www.psc.gov.lk ශ්‍රී ලංකා රාජ්‍ය සේවා කොමිෂන් සභා නිල වෙබ් අඩවියේ පහත වෙබ් පිටුවේ පළ කර ඇත.

මුල් පිටුව ⟶ බාගත කිරීම් ⟶ ක්‍රියා පටිපාටි ⟶ විශේෂ තෝරා ගැනීමේ පටිපාටිය

III. සීමිත තරග විභාගය මගින් උසස් වීම් ලද යම් අයදුම්කරුවකු උසස් වීමේ ලිපිය නිකුත් කළ දින සිට ලිත් මසක කාලයක් ඇතුළත අනුයුක්ත කරන ලද සේවා ස්ථානයේ රාජකාරි සඳහා වාර්තා නොකිරීම, එම උසස් වීම අවලංගු කිරීමට හේතුවන කරුණක් සේ සලකනු ලබන අතර එම නිලධාරියා වෙත ලබා දී ඇති අධි ශ්‍රේණියේ උසස් වීම නැවත විමසීමකින් තොරව අවලංගු කිරීමට කටයුතු කරනු ලැබේ. ඒ සම්බන්ධයෙන් සිදු කරනු ලබන අභියාචනා ද සැලකිල්ලට ගැනීමෙන් තොරව ප්‍රතික්ෂේප කිරීමට මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

IV. මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන ඉදිරි දිනයකදී සිට මෙම උසස්වීම බලාත්මක වේ.

V. පළමු පත්වීම් ලැබූ සේවා ස්ථානයේම අවම වශයෙන් වසර 03ක් අනිවාර්යෙන්ම සේවය කළ යුතුය. කෙසේ වෙතත් පත්කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලබන යම් සුවිශේෂී හේතු මත එම කාලය අවසන්වීමට පෙර යම් නිලධාරියකු මාරු කිරීමට අවශ්‍ය වන්නේ නම්, පත්කිරීම් බලධරයා හට ඒ සඳහා බලය ඇත.

VI. ලිඛිත පරීක්ෂණයෙන් සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලබන අයදුම්කරුවන්ගේ නම් ඇතුළත් ප්‍රතිඵල ලේඛනය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ දැනුම් දීම අනුව විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලබාදෙන අතර සෙසු අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල www.results.exams.gov.lk වෙබ් අඩවියේ පළ කිරීම හෝ පෞද්ගලිකව දන්වා යැවීම විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් සිදු කෙරෙනු ඇත.

14. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

15. රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2014.04.07 දිනැතිව අනුමත කරන ලද 2013.04.02 දින සිට ක්‍රියාත්මක මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද එම ව්‍යවස්ථාවේ දැනටමත් කර ඇති හෝ මින් මතුවටත් කෙරෙන සංශෝධනවලට ද යටත්ව මෙම විභාගය පැවැත්වීම සහ අධි ශ්‍රේණියට උසස් කිරීම සිදුකරනු ලැබේ.

16. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට ද මෙම නිවේදනයේ රෙගුලාසි සලසා නොමැති කරුණු පිළිබඳව තීරණ ගැනීමට ද මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

17. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුත්තේය.

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

කේ.එන්.පී.අයි.ඩී.පී. විජේතිලක,
ලේකම්,
මධ්‍යම පළාත් සභාවේ
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

2025 සැප්තැම්බර් 19 වැනි දින,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 244, කටුගස්තොට පාර,
මහනුවර.